උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ
ප්‍රයෝජනය සඳහා පමණි.

30689

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2568 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2024

S 2

(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය

පැ තුනයි

අතිරේක කියවීම් කාලය විනාඩි 10යි.

- I කොටසේ ප්‍රශ්නය ද, II වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැ.යු. I කොටසේ ප්‍රශ්නයට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියා, II කොටසේ පිළිතුරු සමඟ අමුණා භාරදෙන්න.

J.A.J.R. Jayakody
Deputy Commissioner of Examinations
Confidential (I/E)
Department of Examinations, Sri Lanka
Pelawatta, Battaramulla

විභාග අංකය .....

I කොටස

1. (i) ඇසුරට සුදුසු මිත්‍රයෙකු කෙබඳු අයෙකු විය යුතු දැයි ඔබට නියමිත ධම්මපද ගාථා ඇසුරෙන් ලියන්න. *(ලකුණු 02 යි)*

.....

.....

.....

.....

(ii) ක්ලේශප්‍රහාණය සඳහා වෙහෙසවන බුද්ධශ්‍රාවකයෙකුට විකාල භෝජනයෙන් වැළකීම මගින් ලද හැකි ප්‍රයෝජන දෙකක් දක්වන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(iii) බෞද්ධ සමාජයෙහි භාවිතවන **සතර** පොහොය නම් කරන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(ඊ) .....

(iv) සීලයට අයත් 'බ්‍රහ්මචාරී වීම' යන්නෙහි අදහස දක්වන්න. *(ලකුණු 02 යි)*

.....

.....

.....

(v) කුල පුත්‍රයෙකු මහණ බමුණන්ට උපස්ථාන කළ යුතු කරුණුවලින් දෙකක් සිගාලෝවාද සූත්‍රය ඇසුරෙන් ලියා දක්වන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(vi) මහා කපි ජාතකයෙන් උගත හැකි ආදර්ශ දෙකක් දක්වන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

[දෙවැනි පිටුව බලන්න.

Past Papers Wiki

(vii) ධර්මයෙහි දැක්වෙන දැහැමිව ධනය උපයන පුද්ගලයෙකු තුළ ඇති ගුණාංග දෙකක් ලියන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(viii) පහත සඳහන් පාලි පාඨ සිංහලයට නගන්න. *(ලකුණු 04 යි)*

(අ) දාරුං නමයන්ති තච්ඡකා - අත්තානං දමයන්ති පණ්ඩිතා

.....

.....

(ආ) සබ්බෙ තසන්ති දණ්ඩස්ස - සබ්බේ භායන්ති මච්චුනො

.....

.....

(ix) පහත සඳහන් අදහස් ඇතුළත් ධම්මපද ගාථා ලියන්න. *(ලකුණු 04 යි)*

(අ) යම් සේ බමරා මලත් එහි පැහැය හා සුවඳත් නො නසා රොත් ගෙනයයි ද එමෙන් ම මුනිවරයා (භික්ෂුව) ගමෙහි හැසිරෙයි.

.....

.....

.....

.....

(ආ) පෘතග්ජන පුද්ගලයා යම් තැනක නො ඇලේ ද එම වන පෙදෙස සිත්කලු ය. කම් සැප නොසොයන රහතන් වහන්සේ එහි ඇලෙති.

.....

.....

.....

.....

(x) 'අ' කොටසේ යෙදුමට ගැළපෙන යෙදුම 'ආ' කොටසෙන් තෝරා එයට අදාළ අංකය 'අ' කොටසේ යෙදුමට ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න. *(ලකුණු 06 යි)*

'අ'		'ආ'
උපනිෂද්	.....	1. සිතෙන් වන අකුසලයකි.
අභිජ්ඣා	.....	2. කර්ම විපාකයකි.
තාදි ගුණය	.....	3. ගෙලෙහි මැණිකක් ඇත්තා
තම්බදාඨික	.....	4. අටලෝ දහමෙන් කුම්පා නොවේ.
නන්ද ගොපල්ලාගේ මරණය	.....	5. චෝර ඝාතක
මණි කණ්ඨ	.....	6. පැරණි සාහිත්‍ය මූලාශ්‍රය

* *

[තුන්වැනි පිටුව බලන්න.

28

Past Papers Wiki

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් ගේ
ප්‍රයෝජනය සඳහා පමණි.

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2568 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2024 **S 2**

(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය

- ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

1. (i) බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ට ශික්ෂා පැනවීමේදී අපේක්ෂා කළ ප්‍රයෝජන හතරක් ලියන්න. *(ලකුණු 04 යි)*
   (ii) සංඝාදිසේසාපත්තියට පත් වූ භික්ෂුවක් එම ඇවතින් පිරිසිදුවීමට අනුගමනය කළයුතු ක්‍රියාමාර්ගය පහදා දෙන්න. *(ලකුණු 06 යි)*
   (iii) 'විනය වනාහි ශාසනයාගේ ආයුෂය වේ.' මෙම ප්‍රකාශය විස්තර කරන්න. *(ලකුණු 08 යි)*

2. (i) ධම්මික සූත්‍රයෙහි සඳහන් බුදු ගුණ දෙකක් දක්වන්න. *(ලකුණු 04 යි)*
   (ii) ධම්මික සූත්‍රයෙහි විස්තරවන පැවිදි පිළිවෙත් තුනක් දක්වා ඒවා අගය කරන්න. *(ලකුණු 06 යි)*
   (iii) ගිහි බෞද්ධයෙකුට යාවජීව වශයෙන් ආරක්ෂා කළ හැකි අති විශිෂ්ට චර්යා පද්ධතියක් "ගිහි වත" ලෙස දහමෙහි සඳහන් වේ. ධම්මික සූත්‍රය ඇසුරෙන් මෙය පහදා දෙන්න. *(ලකුණු 08 යි)*

3. (i) අර්ථවත් ජීවිතයක් ගොඩනඟා ගැනීමට උපකාරවන ධර්ම කරුණු ඇතුළත් ධම්මපද ගාථාවක් ලියන්න. *(ලකුණු 04 යි)*
   (ii) ඉහත (i) ගාථාවෙහි අදහස දක්වා අර්ථවත් ජීවිතයක් ගොඩනඟා ගැනීමට එම ධර්ම කරුණු ඉවහල්වන අයුරු දක්වන්න. *(ලකුණු 06 යි)*
   (iii) ධම්මපද ගාථාවල දැක්වෙන ඉගැන්වීම් හොඳින් වටහාගත හැක්කේ එම ගාථාවල නිදාන කථාව අධ්‍යයනයෙනි. උදාහරණ මගින් පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

4. (i) ශිෂ්‍යයාගේ අභිවෘද්ධිය සඳහා නිරන්තරයෙන් ක්‍රියාකරන සැබෑ ගුරුවරයෙකු සතු ගුණාංග හතරක් ලියන්න. *(ලකුණු 04 යි)*
   (ii) තම අභිවෘද්ධිය සඳහා වෙහෙසවන ගුරුවරයාට ශිෂ්‍යයා විසින් දැක්විය යුතු යුතුකම් හා ආචාර විධි භික්ෂු විනයට (විනය පිටකයට) අනුව හෝ ගිහි විනයට (සිගාලෝවාද සූත්‍රයට) අනුව විස්තර කරන්න. *(ලකුණු 06 යි)*
   (iii) ගුරුවරයාගේ සහ ශිෂ්‍යයාගේ වගකීම් හා යුතුකම් ඉටුවන විට සමාජයේ යහපත් පැවැත්ම තහවුරුවන අයුරු පෙන්වා දෙන්න. *(ලකුණු 08 යි)*

5. (i) තිත්තිර ජාතකයෙහි සඳහන්වන වටුවා තමා වැඩිහිටියා බව ඔප්පු කළ අයුරු දක්වන්න. *(ලකුණු 04 යි)*
   (ii) භික්ෂු ශාසනයෙහි වැඩිමහළු පිළිවෙල ක්‍රියාත්මකවන අයුරු තිත්තිර ජාතක කථාව ඇසුරෙන් විස්තර කරන්න. *(ලකුණු 06 යි)*
   (iii) මේ පාඨය සිංහලයට නගන්න.

   "පච්ඡා ආගතා ථෙරා සේනාසනානි න ලභන්ති. සාරිපුත්තත්ථෙරස්සා'පි අන්තේවාසිකා ථෙරස්ස සේනාසනං පරියෙසන්තා න ලභිංසු. ථෙරෝ සෙනාසනං ආලභන්තෝ සත්ථු සේනාසනස්ස අවිදූරෙ එකස්මිං රුක්ඛමූලේ නිසජ්ජාය ච වංකමෙන ච විහිනාමෙසි. සත්ථා පච්චූස සමයේ නික්ඛමිත්වා උක්කාසි. ථෙරොපි උක්කාසි කො එසොති? අහං භන්තෙ සාරිපුත්තොති." (තිත්තිර ජාතකය) *(ලකුණු 08 යි)*

[හතරවැනි පිටුව බලන්න.

6. (i) බුදුරජාණන් වහන්සේ විසින් සත්තිගුම්බ ජාතකය දේශනා කිරීමට හේතු වූ සිද්ධිය ලියන්න. *(ලකුණු 04 යි)*

(ii) පුද්ගල චර්යාවන් කෙරෙහි ආරයට වඩා පරිසරය බලපාන අයුරු සත්තිගුම්බ ජාතක කථාව ඇසුරෙන් පෙන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

(iii) මෙම පාඨය සිංහලයට නගන්න.

අතීතෙ උත්තර පඤ්චාල නගරෙ පඤ්චාලෝ නාම රාජා රජ්ජං කාරෙසි. මහාසත්තෝ අරඤ්ඤායතනෙ එකස්මිං සානු පබ්බතෙ සිම්බලීවනෙ එකස්ස සුව රඤ්ඤො පුත්තො හුත්වා නිබ්බත්ති. ද්වේ භාතරො අහේසුං, තස්ස පන පබ්බතස්ස උපරි වාතේ චොර ගාමකො අහොසි. පඤ්චන්නං චොර සතානං නිවාසෝ අධෝ වාතෙ අස්සමො පඤ්චන්නං ඉසි සතානං නිවාසෝ. (සත්තිගුම්බ ජාතකය)

(ලකුණු 08 යි)

7. (i) පහත වාක්‍ය සිංහලයට නගන්න.

(අ) යුවතියො පදුමානි ඔචිනිතුං නදිං ගච්ඡිංසු.

(ආ) මාතා විහාරං ගන්ත්වා ධම්මං සුත්වා දානං දෙති.

(ඉ) භික්ඛූ භාගවතො සන්තිකං ආගන්ත්වා වන්දිත්වා එකමන්තං නිසීදිංසු.

(ඊ) සා දේවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි. *(ලකුණු 08 යි)*

(ii) පහත වාක්‍යය පාලියට නගන්න.

(අ) මම බුදුන් ද දහම් ද සඟුන් ද සරණයමි.

(ආ) මව බත් පිස ළමයින්ට දෙයි.

(ඉ) අපි සියලුම චෛත්‍යය වඳිමු.

(ඊ) එක් කලෙක බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩසිටි සේක.

(උ) භික්ෂුව ගම් වැසියන්ට ධර්මය දේශනා කරන්නේ ය. *(ලකුණු 10 යි)*

* * *

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library